# අම්පාර, පියන්ගල ප්‍රාථමික ශෛලියේ ගුහා සිතුවම්

චන්දිම බණ්ඩාර අඹන්වල සහ මහින්ද කරුණාරත්න

## Abstract

Cave or rock paintings in the primitive style are not only an artistic reflection of Sri Lankan heritage, but also a socio-archaeological representation. Several such paintings of the same style have been found on a naturally set stone roof, which however was drip ledge carved and prepared for the use of Buddhist monks in the historical period at the Piyangala archaeological site in the Ampara district. The main objective of this study was to document all of these paintings in a systematic manner, with a specific attention on these paintings, and also to provide a comparative interpretation of the paintings in the Sri Lankan primitive style as a whole. These paintings were depicted at a height of about 2/3 feet above ground level at the time of this study (2012). It can be observed that a significant number of the paintings found on this rock plateau have been degraded due to natural causes but some of the paintings are considerably preserved. If the authors of these paintings as a whole were striving for totality, the recognition of that potential in the present context would be limited. Accumulated in four clusters, the paintings are



numerically recognized as 19 separate ones. As determined by previous researchers, these images can be classified as human figures, animal figures, and indistinguishable figures. Among them, a scene of a family and a depiction of elephant hunting are notably recognizable. As shown in this document, the paintings in clusters 1, 2, and 3 are painted in pale white and may have been used lime plastered or diluted ash. It is significant that the paintings in the no. 4 cluster are painted in dark green. Since the comparison and external factors these paintings would be belonged to the historical period.

***Key words:*** Cave paintings, Elephant hunting, Piyangala temple, Primitive style, Rock paintings, Family,

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පියංගල ප්‍රාථමික ශෛලියේ පර්වත සිතුවම් පිළිබඳ ව මෙම ලේඛනයේ දි අවධානය යොමුකර ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි සුප්‍රසිද්ධ බෞද්ධ විහාරයක් වූ පියංගල පුරාවිද්‍යා ස්ථානයට සමීපව ස්ථානගත වී ඇති ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත 'පියන්ගල ලෙන් චිත්‍ර' පුරාවිද්‍යා ස්ථානයේ (**70.30' 47.55" N, 810.37' 05.29"E**) මෙම සිතුවම් දැකගත හැකි වේ. අම්පාර උහන මහඔය මහාමාර්ගයේ ( 27) සිට මීටර් 200ක් පමණ ඔබ්බෙන් මෙම සිතුවම් සහිත ගල්ලෙන පිහිටා ඇත. රජගල පුරාවිද්‍යා ස්ථානය හා පුළුකුණාවි පුරාවිද්‍යා ස්ථාන ද මෙම සංකීර්ණයට ආසන්න ව ස්ථානගත වී ඇති තවත් ප්‍රකට ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යා ක්ෂේත්‍ර දෙකකි. මෙයින් රජගල පුරාවිද්‍යා ස්ථානයේ මධ්‍යම ප්‍රමාණයේ ගල්ලෙනක සටහන් කර ඇති සිතුවම් පියංගල සිතුවම් සමඟ සංසන්දනාත්මක අධ්‍යයන සඳහා යොදාගත හැකි ස්ථානයක් වශයෙන් ද දැක්විය හැකි වේ (**Nandadeva 1986:201, Somadeva 2012:172-176**).

පියන්ගල සිතුවම් සහිත ගල් පියස්ස දිග මීටර් 42ක් ද, පළල මීටර් 6.83ක් ද උස මීටර් 8ක් ද වේ (ඵලක අංක **1" Somadeva**

**2012:167**). මෙහි උතුරු පසට යොමු වූ ගුහා විවරයේ බිත්තිය මත මෙම සිතුවම් පෙළ සටහන් කර ඇති අතර මේ වන විට එකී සිතුවම් පොළොව මට්ටමේ සිට අඩි 2-3ක් අතර උසකින් පවතින බව දැකගත හැකි අතර සෝමදේව පෙන්වා දෙන්නේ ලෙනේ පොළොව මට්ටම ක්‍රමානුකූලව පසින් පිරී යාම නිසා දැන් වන විට මේ සිතුවම් මේ මට්ටමින් දැකගත හැකි බවයි (**Somadeva 2012:169**).

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ශෛලියේ පර්වත සිතුවම් පිළිබඳ ව අධ්‍යයනය කිරීම මේ වන විට (2022) අවුරුදු 125ක් දක්වා සමීප වී ඇත (**Nandadeva 1986:173;1998:337, Somadeva 2012:26-28**). මෙම සිතුවම්වල කාලනීර්ණය පිළිබඳ ව සාකච්ඡා කිරීමට විද්වතුන් විසින් අවස්ථා සීමිත ගණනක දී පමණක් උත්සාහ කර ඇත (**Nandadeva 1992:340,344, Somadeva 2012:96-103**). එහෙත්, එයින් එක් අවස්ථාවක දී පමණක් ප්‍රාථමික ශෛලියට අයත් පර්වත සිතුවම් පිළිබඳ ව විශ්වාසනීය කාලනීර්ණ ලැබී ඇත (Wijepala 1997:441). මෙම ශෛලියේ සිතුවම් තුළින් මෙරට ප්‍රාග් ඓතිහාසික කලාව නිරූපණය කරන බව පෙන්වා දීමට සමහර ලේඛකයින් උත්සාහ කර ඇතත් (**වජිර හිමි 1998, වික්‍රමසිංහ 2001**) ඒම අදහස් ශාස්ත්‍රීය වශයෙන් පිළිගත හැකි ශක්තිමත් කරුණු මත ඉදිරිපත් වී නොමැත. මෙරට ප්‍රාග් ඓතිහාසික සන්දර්භයෙන් අනාවරණය වන මානව කෘති හා ඒවායේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ ව විධිමත් ව විවරණය කිරීමට ප්‍රශස්ත උත්සාහ දරා ඇතත් එම අධ්‍යයන තුළින් ම ප්‍රාථමික ශෛලියේ සිතුවම් වැනි නිශ්චිත නොවන කෘති පිළිබඳ විධිමත් ව අධ්‍යයනය කිරීමේ සීමාකම් පෙන්වා දෙනු ලැබ ඇත (**Perera 2010:182-186**). සියලු කරුණු තුලනාත්මකව සලකා බලන විට මෙතෙක් මෙරටින් අනාවරණය වී ඇති ප්‍රාථමික සිතුවම් ප්‍රාග් ඓතිහාසික සිතුවම් වශයෙන් නිශ්චිත ව දැක්විය නොහැකි වුවත් (දැරණියගල 1991:22) ඒවා අතර ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් චිත්‍රණය කරන ලද සිතුවම් කීපයක් හෝ තිබීමට හව්‍යතාවක් ඇත. එහෙත්, එකී කරුණු පිළිබඳ ව විධිමත්ව සිදුකරන අධ්‍යයන මඟින් තහවුරු කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ පවතින මෙම ශෛලියට අයත් සිතුවම් අතුරින් බදුල්ල දිස්ත්‍රික්කයේ, කුරුල්ලන්ගල නම් ස්ථානයේ ඇති සිතුවම් ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් කළ නිර්මාණ වශයෙන් සලකා බැලිය හැකි වැදගත් ස්ථානයක් වශයෙන් යෝජනා කළ හැකි වේ.



## පර්යේෂණ ඉතිහාසය

දිවයිනේ ප්‍රාථමික ශෛලියේ පර්වත/ගුහා සිතුවම් අතර ඇති ආලේපන (paintings) yd iSreï (engravings) යන ශෛලීන් ද්වයම නියෝජනය කරන සිතුවම් පිළිබඳ අවස්ථා ගණනාවක දී ම විද්වතුන්ගේ අවධානය යොමු වී ඇතත් මෙම ලේඛනයට ප්‍රස්තුත වී ඇති පියන්ගල සිතුවම් පිළිබඳ ව අවස්ථා සීමිත ප්‍රමාණයක දී පමණක් අවධානය යොමු වී ඇත. මෙම ස්ථානය මෙරට සංචාරකයන්ගේ ගමනාන්තයක් නොවීම මෙන් ම කැපී පෙනෙන සිතුවම් රැසක් හෝ දැකගත නොහැකි වීම මෙම සංචාරකයන්ගේ හා වෙනත් නරඹන්නන් ඇතුළු විද්වතුන්ගේ අවධානය අඩු වීමට හේතු වන්නට පුළුවන.

මේ දක්වා ප්‍රකාශිත තොරතුරු අනුව, 2012 වසරේ දි පියන්ගල ප්‍රාථමික ශෛලියට අයත් සිතුවම් පවතින බව ප්‍රකාශයට පත් වී ඇති අතර 2005 වසරේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද පුරාවිද්‍යා ගවේෂණයක දී ප්‍රියන්ත කප්පාගොඩ හා ඉන්දික ගුණවර්ධන විසින් මෙම සිතුවම් පළමු වැනි වරට හඳුනාගෙන වාර්තා කර ඇති බව දක්වා ඇත (**Wijethunghe 2012:213-214**). එයින් අනතුරුව මෙරට ප්‍රාථමික ශෛලියේ සිතුවම් අළලා සිදුකළ ප්‍රශස්ථ අධ්‍යයනයක දී පියන්ගල සිතුවම් පිළිබඳ ව සැලකිය යුතු අවධානයක් යොමුකර ඇත (Somadeva 2012:167-171). ලක්දිව ප්‍රාථමික ශෛලියේ සිතුවම් පවතින ස්ථාන ගණනාවක් පිළිබඳ ව අවධානය යොමුකරමින් සිදුකළ අධ්‍යයනයක් වන එකී අධ්‍යයනයේ දී පියන්ගල සිතුවම් පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීමට අවස්ථාව ලැබී ඇත. පියන්ගල ගල් පියැස්සේ තිබි ප්‍රාග් ඓතිහාසික තිරුවාණා ගල් මෙවළම් කොටස් කීපයක් ද මතුපිටින් හඳුනාගත හැකි වූ බවත් දක්වා ඇත (**Somadeva 2012:168**). එකී ලේඛකයා විසින් මෙම සිතුවම් සමුච්චය පිළිබඳ ව පුළුල්ව අවධානය යොමු කරමින් මෙම සිතුවම් තලයේ මානව රූප, සත්ව රූප හා ජ්‍යාමිතික හැඩ රූප නිරූපණය කරන සිතුවම් කීපයක් ඇති බව පෙන්වා දී ඇත (**Somadeva 2012:169**).

## අරමුණ

පියන්ගල සිතුවම් පිළිබඳ ව සිදුකර ඇති පූර්ව අධ්‍යයන විමසීමේ දී මෙම සිතුවම් සහිත ලෙන් පද්ධතිය හා එහි අන්තර්ගත සිතුවම්

පිළිබඳව විද්වතුන්ගේ අවධානය යොමු වී ඇති බව හඳුනාගත හැකි විය. එයින් එක් අධ්‍යයනයක දී පුළුල් සන්දර්භයක තබා මෙම සිතුවම් පිළිබඳ අධ්‍යයනය කිරීමට පෙළඹී ඇත (**Somadeva 2012**). මෙම අධ්‍යයනයේ දී පියන්ගල සිතුවම් ක්ෂේත්‍රයේ පවතින ප්‍රාථමික ශෛලියේ සිතුවම් පිළිබඳව කේන්ද්‍රීය අවධානය යොමු කරමින් අදාළ මිනුම් සහිතව වාර්තා කිරීම එම සිතුවම් කේවල වශයෙන්, සංචිත වශයෙන් හා සමස්ත වශයෙන් විධිමත්ව වාර්තා කිරීම අරමුණු කර ඇත. එමෙන්ම, සමස්ත සිතුවම් ආවලිය පිළිබඳ අභිනව අර්ථ දැක්වීමක් ලබා දීමේ ද්විතීය අරමුණක් පවති.

## ක්‍රමවේදය

පර්වතය මතුපිට සටහන් කරන ලද සිතුවම් අධ්‍යයනය කිරීම සඳහා මෙම ලේඛකයන් විසින් මීට ඉහත දී සිදුකරන ලද එවැනිම දත්ත වාර්තාකරණය සඳහා යොදාගන්නා ලද ක්‍රමවේද (අඹන්වල හා කරුණාරත්න 2012) මෙම අධ්‍යයනය සඳහා ද යොදාගන්නා ලදි. ඒ අනුව, විනිවිද පෙනෙන පොලිතීන් (Cellophane), ස්ථාවර වර්ණ යෙදවුම් (Permanent Marker) හා තාවකාලික බන්ධනකාරක (Blue Tag) ප්‍රමුඛ වශයෙන් යොදාගන්නා ලදි. තාවකාලික බන්ධනකාරක යොදාගනිමින් පොලිතීන් සිතුවම් සහිත ගල් තලයේ රඳවා එකී ගල් තලය සූක්ෂමව නිරීක්ෂණය කරමින් ස්ථාවර වර්ණ යෙදවුම් මගින් සියුම්ව පොලිතීන් මතට සිතුවම් පිටපත් කරගන්නා ලදි. හඳුනාගත හැකි සියලු සිතුවම්, එනම් අඩ වශයෙන් විනාශ වී ඇති සිතුවම් සියල්ල ද විධිමත් ව පවතින උපරිම සාධක අනුව පිටපත් කරන ලදි. විවිධ වර්ණ මඟින් සටහන් කර ඇති සිතුවම් පිටපත් කිරීම සඳහා එකිනෙකට වෙනස් ස්ථාවර වර්ණ යෙදවුම් යොදාගන්නා ලදි. ඊට තදානුරූපීව ක්ෂේත්‍ර සටහන් ද යොදාගන්නා ලද අතර අංකිත කැමරාව මගින් එම සිතුවම් ඡායාරූපගත කරන ලදි. එයින් පසු පොලිතීන් මතට ලබාගන්නා ලද සිතුවම් පිටපත්, නැවත අංකිත කැමරාව මගින් පරිමාණ සහිතව ඡායාරූපගත කර පොටෝෂොප් (Adobe Photoshop) මෘදුකාංගය ඔස්සේ කළු වර්ණය භාවිත කරමින් එම සිතුවම් පොකුරු හා කේවල වශයෙන් ප්‍රතිනිර්මාණය කරගන්නා ලදි. පොලිතීන් පිටපත් අනුව අදාළ සිතුවම්වල මිනුම් ද ලබාගෙන වාර්තා කරන ලදි. ඉක්බිති ක්ෂේත්‍ර සටහන්, පූර්ව අධ්‍යයන, පෙර



කී සිතුවම්වල සියලු පිටපත් හා පරිගණකගත කරන ලද ප්‍රතිඡායා උපකාර කරගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකරන ලදි.

## ප්‍රතිඵල

පියන්ගල ලෙන් සිතුවම් සමුච්ඡය නියෝජනය කරන නිර්මාණ විධිමත්ව වාර්තා කිරීම ප්‍රමුඛ අරමුණ කරගනිමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී එකී ස්ථානයේ පවතින සිතුවම් සියල්ලම විධිමත් ව වාර්තා කිරීමට උත්සාහ කරන ලදි. පියවි ඇසින් සිදුකරන ලද සූක්ෂ්ම නිරීක්ෂණ අනුව, ගල් තලය මත ඇති සිතුවම් සංචිත/පොකුරු 4ක් වශයෙන් හඳුනාගෙන ඒවා වෙන් වෙන් වශයෙන් පිටපත් කර වාර්තා කරන ලදි. පොකුරු වශයෙන් සිතුවම් වර්ග කිරීමේ දී එකී සිතුවම් අතර ඇති භෞතික සමීපතාව නිර්ණායකය කරගන්නා ලද අතර මෙම සිතුවම් පොකුරු අංක කිරීම, සිතුවම් තලයේ වම් පස සිට සිදුකර ඇත. සියලු මිනුම් මෙට්‍රික්ස් පදනම අනුව සිදුකර ඇත. සිතුවම් වාර්තාකරණයේ දී සම්පූර්ණ සුරක්ෂිත සිතුවම් මෙන් ම ස්වාභාවික හේතු නිසා කොටස් විනාශ වී ඇති සිතුවම් ඒවායේ ශේෂ වී ඇති කොටස් අනුව විධිමත් හා උපරීම ආකාරයෙන් වාර්තා කරන ලදි. සම්පූර්ණ වශයෙන් පවතින හෝ ශේෂ වී ඇති සිතුවම්වල කොටස් වශයෙන් විශේෂණය කිරීමක් සිදු නොකර වෙන් වෙන් සිතුවම් වශයෙන් සිතුවම් අංකණය කර ඇත. ඒ අනුව, පළමු වැනි සිතුවම් පොකුර සිතුවම් 4කින් ද (ඵලක අංක 3: අංක 1, 2, 3 හා 4), දෙ වැනි සිතුවම් පොකුර සිතුවම් 4කින් (ඵලක අංක 4: අංක 5, 6, 7 හා 8) ද තෙ වැනි සිතුවම් පොකුර සිතුවම් දෙකකින් (ඵලක අංක 5: අංක 9 හා 10) හා සිව් වැනි සිතුවම් පොකුර සිතුවම් 9කින් (ඵලක අංක 6: අංක 11, 12, 13, 14, 15, 16, 17, 18 හා 19) ද සමන්විත වන ආකාරයට අංකණය කර වාර්තා කරන ලදි. ඊට අදාළ දත්ත හා විස්තර පහත දක්වා ඇත.

### පළමු වැනි සිතුවම් පොකුර




අංක 1 සිතුවම් පොකුරේ සිතුවම් 4ක් (අංක 1, 2, 3 හා 4 සිතුවම්) දැකගත හැකි අතර සම්පූර්ණ සිතුවම් තලය දෙසට හැරී සිටින අයෙකුගේ වම් පස කෙළවර මෙම සිතුවම් පොකුර දැකගත හැකි වේ. මෙම සිතුවම් පොකුරේ ඇති සිතුවම් අඳුරු සුදු පැහැයට

| | |
|---|---|
| 1.  | උස සෙන්ටි මීටර් 8ක් වන මෙම සිතුවමේ උපරිම පළ, සෙන්ටිමීටර් 16කි. සම්පූර්ණ වශයෙන් සුදු පැහැය භාවිතයෙන් පූරණය කර කිබූ සිතුවමේ මේවන විට දැකකිය හැක්කේ ඒ මුල් වර්ණ තැවරුම නිසා අති වූ ඡායා සටහනක් පමණි. දැනට පවතින අවශේෂ අනුව, සිවු ප සත්ව රුවක් නිරූපණය කර තිබූ බව අනුමාණ කළ හැකි වේ' |
| 2.  | රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1ක් පමණ වන සිතුවමේ සම්පූර්ණ උස සෙන්ටි මීටර් 8කි. පළල සෙන්ටි මීටර් 13කි. ස්වාභාවික හේතු නිසා කොටස් භායනය වී පැතියත් මෙම සිතුවමින් ද සිවු පා සතෙකු නිරූපණය කර ඇති බව හඳුනාගත හැකි වේ. |




| | |
|---|---|
| 3.  | සිතුවමකින් ශේෂ වූ කොටසක් වන මෙහි දැනට පවතින කොටසේ උස සෙන්ටි මීටර් 4ක් ද පළල සෙන්ටිමීටර් 10ක් ද වේ. රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1කි. මෙයින් කුමක් රූපණය කරන්නේ ද යන්න හඳුනාගැනීමට තරම්පවතින සාධක ප්‍රමාණවත් නොවේ. |
| 4.  | රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර්1 වන මෙම රූපය ද යම්කිසි සිතුවමකින් ශේෂ වී ඇති කොටසකි. මෙහි උස සෙන්ටි මීටර් 4ක් වන අතර පළල සෙන්ටි මීටර් 1කි. මෙයින් ද සම්පූර්ණ අදහසක් ඇතිකර ගැනීමට තරම් ප්‍රමාණවත් සාධක නොලැබේ. |


### දෙ වැනි සිතුවම් පොකුර




සාපේක්ෂව වඩාත් හොඳින් සුරක්ෂිත වී ඇති අංක 2 සිතුවම් පොකුරේ සිතුවම් 4ක් (අංක 5, 6, 7 හා 8 සිතුවම්) පවති. සිතුවම් තලයේ වම් පස සිට දෙවැනියට මෙම සිතුවම් පොකුර ස්ථානගත වී ඇත. මෙයට අයත් සියලු සිතුවම් අඳුරු සුදු පැහැති වර්ණාලේපයක් මගින් නිර්මාණය කර ඇත.

| | |
|---|---|
| 5.  | දෙ කෙළවර අතර සම්පූර්ණ උස සෙන්ටි මීටර් 54ක් වන මෙහි පළල සෙන්ටි මීටර් 36කි. මැද ඇති වෘත්තයේ වර්ණාලේප නොකර ඇති කොටසේ අරය සෙන්ටි මීටර් 10කි. මෙම සිතුවම නිරූපණය කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 3ක් පමණ වේ. ඒ අනුව, මෙම සිතුවම් තලයේ ඇති ප්‍රමාණයෙන් විශාලම කේවල සිතුවම වශයෙන් මෙම සිතුවම හඳුනාගත හැකි අතර මේ දක්වා ම සැලකිය යුතු මට්ටමකින් සුරක්ෂිත වී පවති. ප්‍රධාන දිශා හතරින් කෙළවර වන යම්කිසි රේඛාමය රටාවක් රූපය මැද පිහිටි වෘත්තයක් මගින් සම්බන්ධ කර තිබෙන අතර මෙම රූපයෙන් අදහස් වන්නේ කුමක් ද යන්න එක එල්ලේම නිශ්චය කිරීම අපහසු වේ. |
| 6.  | කාලානුරූපව හායනය වීම නිසා යම්කිසි ආකාරයකින් තරමක් විනාශ වූ සිතුවමක් වන මෙහිඋස සෙන්ටි මීටර් 18ක් ද පළල සෙන්ටි මීටර් 6ක් ද වේ. මෙම සිතුවමේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 2.5කි. වර්ණ පූරණය කර නිමවා ඇති මෙම සිතුවමින් අදහස් වන්නේ කුමක් දැයි දැන් පවතින සාධක අනුව නිශ්චය කළ හැකි නොවේ. |



| | |
|---|---|
| 7.  | චතුරස්‍රයක් හා ඒ මැද වෘත්තයක් නිරූපණය කළ සිතුවමකි. මෙයින් අදහස් වන්නේ කුමක් දැයි නිශ්චිත වශයෙක් නොදැක්විය හැකි වුවත් ඒ පිළිබඳ යම් යම් අනුමාණ ගොඩනැඟිය හැකි වේ. මෙම රූ සටහනේ උපරිම උස සෙන්ටි මීටර් 15ක් වන අතර පළල සෙන්ටි මීටර් 13කි.මැදඇති වෘත්තයේ අරය සෙන්ටි මීටර් 5කි. මෙම සිතුවම රූපණය කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1කි. සැලකිය යුතු තරමින් ආරක්ෂා වී ඇති සිතුවමක් වශයෙන් මෙම සිතුවම පෙන්වා දිය හැකි වේ. කේවල වශයෙන් සලකා මෙම සිතුවම අර්ථකථනය කිරීම අපහසු වේ. |
| 8.  | එකිනෙක හා සම්බන්ධ වන සිතුවම් චතුස්කයකි, සංකලනයකි. මෙම සංකලිත සිතුවමේ උපරිම උස සෙන්ටි මීටර් 36ක් ද උපරිම පළල සෙන්ටි මීටර් 18ක් ද වන අතර රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.8කි. සිව් දෙනෙකුගෙන් සමන්විත කුටුම්භයක් මෙම සිතුවමින් නිරූපණය වන බව අනුමාණ කළ හැකි වේ. මැද පිහිටි උස රේඛා සටහනින් එක් පුද්ගලයෙකු ද එයටම සම්බන්ධව උසින් අඩු පුද්ගලයෙකු හෙවත් දරුවකු ද දෙපස තවත් මානව රූප දෙකක් ද නිරූපණය කෙරේ. පියන්ගල සමස්ත රූපාවලියේ පවතින නිර්මාණශීලීත්වය අතින් උසස් ම රූපය වශයෙන් මෙය නම් කළ හැකි වේ. |

**තෙ වැනි සිතුවම් පොකුර**



අංක 3 සිතුවම් පොකුර පර්වත තලයේ වම් පස සිට බැලීමේ දී තෙ වැනියට ස්ථානගත වී ඇති සිතුවම් පොකුරයි. පැහැදිලිව හඳුනාගත හැකි සිතුවම් දෙකක් (අංක 9 හා 10 සිතුවම්) පවතී. මෙම සිතුවම් දෙකෙහි ම සැලකිය යුතු කොටසක් ස්වභාවික හේතු නිසා විනාශ වී ඇතත් අදාළ සිතුවම් පිළිබඳ පැහැදිලි අදහසක් ඇතිකර ගැනීමට එය බාධාවක් වී නොමැත. ඒ අනුව, මුව (Spotted Deer - Axis axis) හෝ ගෝන (Sambhur - Cervus unicolor) වර්ගයට අයත් සතුන් දෙදෙනෙකු මේ සිතුවමින් නිරූපණය කර ඇති අතර වම් පස පිරිමි සතෙකු හා දකුණු පසින් ගැහැණු සතෙකු (අඩු විශ්වාසයකින් යුතුව)නිරූපණය කර ඇතැයි යෝජනා කළහැකි වේ.



| | |
|---|---|
| 9.  | තෙ වැනි සිතුවම් පොකුරට අයත් තලයේ වම්පස සටහන් කර ඇති මෙම සිතුවමේ උස සෙන්ටි මීටර් 20කි. පළල සෙන්ටි මීටර් 23කි. සිතුවම නිරූපණය කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.8කි. අර්ධ වශයෙන් විනාශ වී ඇති මෙම සිතුවමින් මුව හෝ ගෝණ යන සිවු පා සතෙකු නිරූපණය කරන බව සැකයකින් තොරව පැහැදිලි කළ හැකි වේ. මෙම සිතුවම නිරූපණය කර තිබූ ආලේපන තට්ටුවේ වැඩි කොටසක් කාලානුරූපව ඉවත් වී ගියත් ඒ නිසා ඇති වූ ඡායාව හොඳින් හඳුනාගත හැකි ව පවති. |
| 10  | උස සෙන්ටි මීටර් 8ක් ද පළල සෙන්ටි මීටර් 15ක් ද වන මෙම සිතුවම නිරූපණය කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1කි. වර්ණාලේපය අඩ වශයෙන් ඉවත් වී ඇතත් එහි ඇති ඡායාව අනුව අදාළ සිතුවමේ වැඩි කොටසක් පුනර්ජනනය කළ හැකි ව පවති. මෙම සිතුවමේ ගොඩනඟාගත හැකි ඡායාව හා ඊට තදානුසන්න අනෙක් සිතුවම සමඟ පරිපූරක වශයෙන් සැලකීමේ දි මෙම සිතුවම ද මුවෙකු හෝ ගෝනෙකු නිරූපණය කළ සිතුවමක් බව පැහැදිලි කළ හැකි වේ. |

## සිව් වැනි සිතුවම් පොකුර



අංක 3 සිතුවම් පොකුර පර්වත තලයේ වම් පස සිට බැලීමේ දී තෙ වැනියට ස්ථානගත වී ඇති සිතුවම් පොකුරයි. පැහැදිලිව හඳුනාගත හැකි සිතුවම් දෙකක් (අංක 9 හා 10 සිතුවම්) පවතී. මෙම සිතුවම් දෙකෙහිම සැලකිය යුතු කොටසක් ස්වභාවික හේතු නිසා විනාශ වී ඇතත් අදාළ සිතුවම් පිළිබඳ පැහැදිලි අදහසක් ඇතිකර ගැනීමට එය බාධාවක් වී නොමැත. ඒ අනුව, මුව (Spotted Deer - Axis axis) හෝ ගෝන (Sambhur - Cervus unicolor) වර්ගයට අයත් සතුන් දෙදෙනෙකු මේ සිතුවමින් නිරූපණය කර ඇති අතර වම් පස පිරිමි සතෙකු හා දකුණු පසින් ගැහැණු සතෙකු (අඩු විශ්වාසයකින් යුතුව) නිරූපණය කර ඇතැයි යෝජනා කළහැකි වේ.



| | |
|---|---|
| 11.  | උස සෙන්ටි මීටර් 19ක් වන මෙම සිතුවමේ පළල සෙන්ටි මීටර් 20ක් ද රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1ක් ද වේ. මෙම සිතුවම් පොකුරේ මධ්‍යයේ ස්ථානගත කර ඇති මෙම සිතුවමින් සත්ව රුවක් නිරූපණය කර ඇත. පවතින රූපීය ලක්ෂණ අනුව හස්ති රුවක් වශයෙන් හඳුනා ගැනීම වඩා සුදුසු වේ. |
| 12  | බෙහෙවින් විනාශ වී ගිය සිතුවමකට අයත් කොටස් විය හැකි මෙම රේඛාමය සිතුවම් කොටස් ද්වයේ උස සෙන්ටි මීටර් 12ක් ද පළල සෙන්ටි මීටර් 8ක් ද වේ. මෙම ඇඳීම සඳහා භාවිත කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.6කි. සිව් වැනි සිතුවම් පොකුරේ මධ්‍යගත සිතුවමට ඉහළින් දැකගත හැකි මෙම රේඛා දෙකේ පවත්නා හැඩතල හා රිද්මය අනුව, මනුෂ්‍ය රූපී සිතුවමක කොටස් වශයෙන් උපකල්පනය කළහැකි වේ. |
| 13.  | උස සෙන්ටි මීටර් 18ක් වන මෙම රූපයේ පළල සෙන්ටි මීටර් 12කි. රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1කි. සමස්ත රචනාව අනුව සලකා බැලීමේ දී මෙම රූපයෙන් මානව රුවක් නිරූපණය කරන බව සැලකිය හැකි වේ. හස්ති දඩයම සමඟ සම්බන්ධ වී ඇති මෙම මානවයා අදාළ කටයුත්ත සඳහා දෙ අතින් ආයුධ ධරා සිටින බව යෝජනා කළහැකි වේ. |

| | |
|---|---|
| 14.  | මෙම රූපය සමස්ත වශයෙන් සලකා බැලීමේ දි එහි උස සෙන්ටි මීටර් 19ක් වන අතර පළල සෙන්ටි මීටර් 8කි. රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.8ක් වේ. මෙම සිතුවම මඟින් මනුෂ්‍ය රූප දෙකක් නිරූපණය කර ඇති බව අනුමාණ කළ හැකි වේ. ඒ අනුව අදාළ රූපයේ පහළින් සිටින පුද්ගලයා භූමියේ ඉදිරිපසින් හා ඉහළින් සටහන් කර ඇති පුද්ගල රූපය භූමියේ ඈතින් නැතිනම් පළමු පුද්ගලයාට පසුපසින් සිටින බව යෝජනා කළහැකි වේ. |
| 15.  | උස සෙන්ටි මීටර් 14ක් වන මෙම රූපයේ පළල සෙන්ටි මීටර් 6ක් ද රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.6ක් ද වේ. මෙම සිතුවම මඟින් ද මානව රුවක් නිරූපණය වන බව යෝජනා කළ හැකි වේ. ඒ අනුව, සිව් වැනි සිතුවම් පොකුරේ පහළට වන්නට ඇති මෙම රුවෙන් අදාළ සිතුවම් පොකුරේ කේන්ද්‍රියව පිහිටා ඇති හස්තියා දෙසට හැරී සිටින මානව රුවක් නිරූපණය වේ. |
| 16.  | උස සෙන්ටි මීටර් 17ක් වන මෙම සිතුවමේ පළල සෙන්ටි මීටර් 12කි. රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.8ක් වේ. මෙම සිතුවම ද බොහෝ සෙයින් ස්වභාවික හායනයට ලක් වී ඇති නිසා මෙයින් අදහස් වන්නේ කුමක් දැයි යෝජනා කිරීමට හෝ ප්‍රමාණවත් සාධක නොමැත. එහෙත් අඩමාන වශයෙන් මෙයින් ද මනුෂ්‍ය රුවක් නිරූපණය වන බව යම් දුරකට යෝජනා කළ හැකි වේ. |



| | |
|---|---|
| 17.  | උස සෙන්ටි මීටර් 19ක් වන මෙම සිතුවමේ පළල සෙන්ටි මීටර් 29කි. සිතුවම සටහන් කිරීම සඳහා භාවිත කර ඇති රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1ක් වේ. මෙම සිතුවමේ සැලකිය යුතු කොටසක් ස්වාභාවික හේතු නිසා හායනය වී ඇත. ශේෂ වී ඇති සාධක අනුව සිවු පා සතෙකු නිරූපණය කරන සිතුවමක අවශේෂ බව පෙනී යයි. මෙම සිතුවම අයත් සම්පූර්ණ සිතුවම් පොකුර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙම සිතුවම මඟින් ඊලකට අයත් අලියෙකු හෝ ඇතෙකු නිරූපණය වන බව පෙනේ. |
| 18.  | උස සෙන්ටි මීටර් 12ක් ද පළල සෙන්ටි මීටර් 9ක් ද වන මෙම සිතුවමේ රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 1කි. මෙම සිතුවම් පොකුරේ විශේෂ ස්වභාවයකින් නිරූපණය කර ඇති මෙම සිතුවම මඟින් මනුෂ්‍ය රුවක් නිරූපණය කරන බව යෝජනා කළ හැකි වේ. ඒ අනුව, සිතුවම් පොකුරේ ඊසාන දිසාවෙන් ස්ථානගත වී ඇති මෙම සිතුවමේ දැක්වෙන පුද්ගලයා සිතුවමේ කේන්ද්‍රීය ධාරණාව දෙසට යොමු වී ඇති බවත් අතින් ඊතලයක් යෙදූ දුන්නක් ධරණ බවත් හඳුනාගත හැකි වේ. |
| 19.  | මෙම සිතුවම් පොකුරේ මධ්‍යයේ පිහිටි ප්‍රමුඛ සිතුවම වූ හස්ති රුවට ඉහළින් ඊට ආසන්නව සටහන් කර ඇති මෙම වෘත්තාකාර සටහනේ උස සෙන්ටි මීටර් 3ක් වන අතර පළල සෙන්ටි මීටර් 4කි. රේඛාවේ සාමාන්‍ය ඝණකම සෙන්ටි මීටර් 0.5ක් වන අතර වෘත්තයේ අරය සෙන්ටි මීටර් 4කි. මෙයින් කුමන අර්ථයක් ජනනය කරන්නේ දැයි දැක්වීම අපහසු වේ. |

## සාකච්ඡාව

පොකුරු හතරකට අයත් කේවල සිතුවම් 19කින් සමන්විත මෙම සිතුවම්සංචිතය මඟින් නිරූපිත වස්තු විෂය පිළිබඳ ප්‍රොත්සාහි වීමේ දී සිතුවම් සමස්ත වශයෙන් සලකා බැලීම මෙන් ම සිතුවම් පොකුරු වශයෙන් ගෙන සාකච්ඡා කිරීම ද වඩා ප්‍රතිඵලදායි වේ. මෙම සිතුවම් මඟින් 1. සත්වයන් නිරූපණය කිරීම, 2. කුටුම්බ ජීවිතය නිරූපණය කිරීම හා 3. ඇත් දඩයම නිරූපණය කිරීම යන මුඛ්‍ය ප්‍රස්තුත ත්‍රිත්ත්වය නියෝජනය කරන බව යෝජනා කළ හැකි වේ. එම නිරූපණයන්හි දී 1. සිව් පා සත්වයන්, 2. මානව රූප හා 3. වෙනත් රූප නිරූපණ වශයෙන් වර්ගීකරණය කළහැකි වේ.

ප්‍රාථමික ශෛලියේ සිතුවම් සහිත අනෙකුත් ස්ථානවල මෙන් ම මෙම ස්ථානයේ ද සිතුවම්කරණය සඳහා සිතුවම් තලය සකසා ගැනීමක් කිසිසේත්ම සිදු වී නොමැත. ස්වභාවික ගල් පෘෂ්ඨයේ සිතුවම් ඇඳීම සිදුකර ඇති අතර එම සිතුවම් සඳහා දුර්වර්ණ සුදු පැහැය හා දුර්වර්ණ කොළ පැහැය භාවිත වී ඇත. පූර්ව පර්යේෂකයන් ද යෝජනා කර ඇති පරිදි මේ සුදු පැහැති සිතුවම් සඳහා කේඨය සමඟ මිශ්‍ර කරන ලද අළු ආදිය (**Nandadeva 1986:175, Somadeva 2012:51**) වර්ණක වශයෙන් භාවිත වී ඇතැයි යෝජනා කළ හැකි වේ. ශාක පත්‍ර යුෂ මගින් කොළ පැහැය ලබා ගන්නට ඇතැයි අඩු විශ්වාසයකින් යුතු ව යෝජනා කළ හැකි වේ. මෙම සිතුවම් ඇදිම සඳහා ද පෙර පර්යේෂකයින් ද යෝජනා කර ඇති පරිදිම අතෙහි ඇඟිලි උපකාරි කරගන්නට ඇතැයි (**Nandadeva 1986:176,Somadeva 2012:51-53**) පෙන්වා දිය හැක්කේ මෙම සිතුවම්වල රේඛා ද අතෙහි ඇඟිලි මගින් ඇතිවන රේඛාවට සමරූපී බව තහවුරු වන හෙයිනි.

පියන්ගල ලෙන් සිතුවම් පිළිබඳ පුරාවිද්‍යා හා කලා ඉතිහාස දෘෂ්ටියකින් යුතුව අවධානය යොමු කිරීම සිතුවම් පිළිබඳ අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවකි. කේවලසිතුවම් 4කින් සමන්විත පළමු වැනි සිතුවම් පොකුර යම්කිසි අදහසක් ජනනය කිරීමේ අදහසින් හෝ නො එසේ නම් සතුන් නිරූපණය කිරීමේ අරමුණින් කරන ලද සිතුවම් සමූහයක වර්තමාන අවශේෂ වශයෙන් හඳුනාගත හැකි වේ. මෙම සිතුවම් පොකුරේ සිතුවම් අතුරින් අවම වශයෙන් සිතුවම් දෙකකින් (සිතුවම් අංක 1 හා 2) සිව් පා සතුන් නිරූපණය කර ඇති අතර ඒ



සතුන් කවර වර්ගයකට අයත් දැයි හඳුනා ගැනීමට තරම් පවතින සාධක ප්‍රමාණවත් නොවේ. අවශේෂ සිතුවම් කොටස් දෙකින් (සිතුවම් අංක 3 හා 4)ද යම්කිසි සතුන් නිරූපණය කිරීමක් සිදු වී පවතින්නට ද ඇතැයි සිතිය හැකි වුව ඒ සඳහා නිගමන ඉදිරිපත් කිරීමට තරම් ප්‍රමාණවත් සාධක නොමැත.

දෙ වැනි සිතුවම් පොකුර මෙම සිතුවම් අතර ඇති,සැලකිය යුතු මට්ටමකින් සුරක්ෂිත වී ඇති එමෙන් ම අධ්‍යයන වටිනාකමින් ඉහළ සිතුවම් කීපයක් අන්තර්ගත සිතුවම් සමුච්ජයක් වශයෙන් දැකගත හැකි වේ. මෙම සිතුවම් පොකුරේ වම් පසින් පවතින විශේෂ සිතුවම (සිතුවම් අංක 5) මීට පූර්ව අධ්‍යයනයක දී ද වැඩි අවධානයට පාත්‍ර වී ඇති අතර (**Somadeva 2012:170**) මෙම සිතුවම යම්කිසි විශේෂ අදහසක් ජනනය කිරීමේ අරමුණින් රචනා කරන ලද්දක් විය යුතු ය. පෙර කී අධ්‍යයනයේ දී එම රූපය පිළිබඳ පැහැදිලි කිරීමට පමණක් උත්සුක වී ඇත. ජල මූලාශ්‍රයක් වෙත සිව් දිශාවන්ගේ සිටින සතුන්ගේ ආකර්ශනය සිදුවන බව නිරූපණය කිරීමට කළ උත්සාහයක් මෙම සිතුවමින් නිරූපණය වන බව යෝජනා කළහැකි අතර මෙම සිතුවමින්, ව්‍යුක්ත (abstract) කලාත්මක ශෛලියක් නිරූපණය කෙරේ. මෙම සිතුවම් පොකුරේ දකුණු කෙළවර ඇති සිතුවමින් (සිතුවම් අංක 8) පුද්ගල කණ්ඩායමක් නිරූපණය වන බව මෙම ලේඛකයන්ගේ අදහසයි. මධ්‍යයේ රූප ද්විත්වයක් හා දෙපසින් තවත් පුද්ගල රූප ද්විත්වයක් වශයෙන් මෙයින් මානව රූප චතුෂ්කයක් නිරූපණය වන අතර එයින් මැද පිහිටි රූප යුග්මය මඟින් පුරුෂ රූවක් හා පිරිමි දරුවකුගේ රූවක් ද දෙ පස කාන්තා රූ ද්වයක් ද නිරූපණය වන බව යෝජනා කෙරේ. ඒ අනුව, මෙම රූපීය ප්‍රකාශනය මගින් කුටුම්බයක් නිරූපණය වන බව මෙම ලේඛකයන් විසින් යෝජනා කෙරේ. පියන්ගල සමස්ථ රූපාවලිය පිළිබඳ සැලකිලිමත් වීමේ දී අංක 8 දරන සිතුවම වඩාත් ඉහළ කලාත්මක ප්‍රකාශනයක් වශයෙන් දැක්විය හැකි වේ. සිතුවම් පොකුරේ මැද සටහන් කර ඇති වෘත්තයක් හා ඒ වඩා ඇති චතුරස්‍ර සටහන මඟින් (සිතුවම් අංක 7) සතුන් සඳහා යොදා ඇති උගුලක් නිරූපණය කරන බව මෙම ලේඛකයින්ගේ අදහසයි. මෙම සිතුවම් පොකුරේ සියලු සිතුවම් පිළිබඳ සමස්ථාර්තයක් ජනනය කර ගැනීමේ දි මෙවැනි අර්ථකතනයක් සඳහා අවශ්‍ය පිටිබලය සැපයේ. දකුණු පස ඉහළින් ඇති සිතුවම (සිතුවම් අංක 6) ඒ පිළිබඳ උනන්දු

පාඨකයන් නොමඟ යැවීමට සමත් ආකාරයේ රුවක් මේ වන විට ශේෂකර ඇතත්, පූර්ණ රුවකින් කාලානුරූපව විනාශ වී ගොස් ශේෂ වී ඇති කොටසක් වශයෙන් පෙන්වා දිය යුතු වේ.

අධ්‍යයන අවස්ථාව වන විට බෙහෙවින් ගෙවී විනාශ වී පැවති තෙ වැනි සිතුවම් පොකුරේ මේ වන විට දැකගත හැක්කේ සිතුවම් දෙකක් පමණි. පවතින සාධක අනුව එයින් වම් පස සිතුවමින් (සිතුවම් අංක 9) ගෝනෙකු හෝ මුවෙකු නිරූපණය වන බව වැඩි විශ්වාසයකින් යුතුව පෙන්වා දිය හැකි අතර දකුණු පස සිතුවමින් ද (සිතුවම් අංක 10) එම වර්ගයේ ම සිවු පා සත්වයෙකු නිරූපණය කර තිබූ බව පෙන්වා දිය හැකි වේ. නමුත්, මෙම රූපයේ පෙර සිතුවමේ මෙන් අං තට්ටුව අලංකාර අන්දමින් ප්‍රකාශනය වී ඇති ආකාරයක් හඳුනා ගැනීමට සාධක නොමැත. ඒ අනුව, මෙම රූප යුග්මය මගින් පුරුෂ පාර්ශවයට අයත් සත්වයෙකු වම් පස හා දකුණු පස කාන්තා පාර්ශවයට අයත් සතෙකු නිරූපණය කර ඇති බව වැඩිදුරටත් පෙන්වා දිය හැකි වේ.

ශෛලිය, රිද්මය, ප්‍රස්තුතය හා වර්ණ භාවිතය යන සෑම අංශයකින් ම විශේෂ සිතුවම් පොකුරක් වශයෙන් සිව් වැනි සිතුවම් පොකුර හඳුනාගත හැකි වේ. අනෙක් සිතුවම් සමඟ සංසන්දනය කර බැලීමේ දි මෙම සිතුවම් පොකුරේ ශෛලිය හා රිද්මය වෙනස්ම ආරක් ගෙන ඇති ආකාරය නිරීක්ෂණයවේ. අනෙකුත් සිතුවම් සමඟ බැලීමේ දි මෙම සිතුවම්වල රේඛා වඩාත් වේගවත් බවක් මෙන් ම වැඩි රිද්මයානුකූල බවක් පෙන්නුම් කරයි. මෙම සිතුවම් පොකුර සඳහා දුර්වර්ණ කොළ පැහැය සම්පූර්ණයෙන් ම භාවිත වී තිබීම ද විශේෂයකි. මෙරට ප්‍රාථමික ශෛලියේ සිතුවම් සටහන් කිරීම සඳහා සැලකිය යුතු වැඩි අවස්ථාවක දී සුදු පැහැය භාවිත වී පැවතියත් මෙම සිතුවම් පොකුර සඳහා භාවිත වී ඇත්තේ අඳුරු කොළ පැහැයයි. මෙම සිතුවම් පොකුර නිශ්චිත අර්ථයක් නිරූපනය කිරීම සඳහා නිර්මාණය කර ඇති බවත් හඳුනාගත හැකි වේ. එනම්, හස්ති දඩයම නිරූපණය කරන අවස්ථාවක් මෙමගින් නිරූපණය වේ. මෙම සිතුවම් පොකුරේ මැද ඇති සිතුවම (සිතුවම් අංක 11) එම සංචිතයේ මුඛ්‍ය සිතුවම වශයෙන් යෝජනා කරනු ලබන අතර එමගින් අලි රංචුවෙන් වෙන්කර ගන්නා ලද ඇතෙකු නිරූපණය කර ඇත. එම රංචුවේ ඇති තවත් හස්තීන් ද මෙම සිතුවමේ ම නිරූපණය කර ඇති ආකාරය (සිතුවම් අංක 17) හඳුනාගත හැකි වේ. මෙම හස්තියා



වටකරගත් මානව රූප අනෙක් සිතුවම්වලින් දැක්වෙන අතර (සිතුවම් අංක 13, 14, 15, 16 හා 18) එයින් සමහර පුද්ගලයින් ආයුධ දරමින් හා මෙහෙයවමින් සිටින ආකාරය (සිතුවම් අංක 13 හා 18) ද නිරූපණය කර ඇත්තේ නාට්‍යානුසාරි ලක්ෂණ පෙන්නුම් කරමිනි.

සිතුවම්වල නිරපේක්ෂ කාලනිර්ණ සම්බන්ධයෙන් නිගමන ලබාගැනීම මෙම අධ්‍යයනයේ දි අදහස් නොකරනු ලබන අතර එවැනි විධිමත් ක්‍රමවේදයක් මෙරටේ මෙතෙක් අත්හදා බලා නොමැත. නිරපේක්ෂ කාලනීර්ණ සපුරාගන්නා තෙක් මෙම සිතුවම් පිළිබඳ සාපේක්ෂ කාල නීර්ණය පිළිබඳ අදහස් කීපයක් යෝජනා කළ හැකි වේ. මෙම සිතුවම් සහිත ගල්ලෙන් මුල් ඓතිහාසික හෝ ඓතිහාසික යුගයේ නියත වශයෙන් ම බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ වාසභූමි වශයෙන් පැවති බව එවායේ වාස්තු විද්‍යාව පරීක්ෂා කිරීමේ දි තහවුරු වේ. එබැවින්, මෙම සිතුවම් එම භික්ෂූන් වහන්සේලාගෙ වාසභූමි තත්ත්වයෙන් ඉවත් වූ පසු මෙම ස්ථාන තාවකාලික හෝ දිගුකාලිනව ජනාවාස කරගත් මිනිසුන් විසින් නිර්මාණය කරන ලද ඒවා බව පෙන්වා දිය හැකි වේ. මෙම සිතුවම් පොකුරු අතුරින් අංක 1, 2 හා 3 සිතුවම් පොකුරු සම කාලීන බව පැහැදිලි අතර අංක 4 සිතුවම් පොකුර එයින් පරිබාහිර කාලයක් නිරූපණය කරන බව එහි ශෛලිය වැනි සාධක පරීක්ෂා කිරීමේ දි පෙන්වා දිය හැකි වේ. එම සිතුවම් පොකුර පෙර සිතුවම් පොකුරුවලට වඩා පසු කාලීන බව සිතිය හැකි වේ. අංක 1, 2 හා 3 සිතුවම් පොකුරු නිරූපණය කර ඇති මට්ටමට වඩා ඉහළ මට්ටමකින් සිව් වැනි සිතුවම්පොකුර නිරූපණය කර තිබීම මෙන්ම සිතුවම්කරණය සඳහා වඩාත් උචිත ස්ථාන පළමු සිතුවම් පොකුරු තුන විසින් හිමිකර ගෙන තිබීම වැනි සාධක මෙම අදහස වඩාත් තීව්‍ර කිරීමට රුකුලක් ලබා දෙනු ලැබේ.

මෙම සිතුවම්වල කර්තෘත්වය පිළිබඳ නිශ්චිතව පැහැදිලි කළ හැකි සාධක නොමැති වුවත් මෙම ලෙන් වාසභූමි කරගත් දඩයක්කාර රුස්කරන්නන් විසින් මෙම සිතුවම් නිර්මාණය කළ බවට යෝජනා කළ හැකි වන නමුත් එහි කාල සම්බන්ධතාව පිළිබඳව ද නිශ්චිත සාධක දැක්වීමට තරම් ප්‍රමාණවත් සාධක අනාවරණය නොවේ. එහෙත් සමාන්තර සාධක අනුව මෙකී ලෙන් මුල් හා මධ්‍ය ඓතිහාසික යුගයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් නේවාසික ස්ථාන වශයෙන් භාවිත කර අත්හැර දැමීමෙන් පසු මෙම ස්ථාන

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
30 OCT 2023

වෙත සංක්‍රමණය වූ මානව පිරිස් විසින් රූපණය කළ සිතුවම් බව ඉහළ විශ්වාසයකින් යුතුව පෙන්වා දිය හැකි වේ.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලෙන් සිතුවම් සහිත ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ස්ථානයක් වන පියංගල ලෙන් සිතුවම්වල ආරක්ෂාව හා සංරක්ෂණය සම්බන්ධයෙන් සැලකිය යුතු මැදිහත් වීමක් ද සිදුකර ඇති බව ක්ෂේත්‍ර නිරීක්ෂණයේ දි පැහැදිලි වේ. ඒ අනුව, සිතුවම් සහිත ලෙන් අන්තර්ගත ගල් පර්වතයේ ස්වාභාවිකව ඇති වී පවතින විවර පිළිබඳ පරික්ෂා කිරීමේ වැඩ පිළිවෙල (ඵලක අංක 7) හා ස්වභාවිකව සිදු වී ඇති විවර ආවරණය කිරීම සඳහා මැලියම් යෙදීම (ඵලක අංක 3) වැනි ප්‍රතිකර්ම යොදා තිබෙන ආකාරය දැකගත හැකි වේ. එහෙත්, අදාළ ස්ථාන පිළිබඳ නිශ්චිත දත්ත වාර්තා තබා ගැනීම හා සංචාරක ප්‍රජාව මෙවැනි ස්ථාන වෙත වැඩිවැඩියෙන් නැඹුරවන ආකාරයේ වැඩපිළිවෙළක් යෙදීම ද මෙම උරුම ස්ථාන ආරක්ෂා කරගැනීම සඳහා අත්හදා බැලිය හැකි සාධනීය ඉදිරි මැදිහත්වීම් වනු ඇත.


ස්තුතියඃ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සඳහා ප්‍රවාහන හා අනෙකුත් පහසුකම් සැලසූ කොළඹ 7, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (විශ්‍රාමික), ආචාර්ය පී. විදානපතිරණ මහත්මියටත්, ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සඳහා සහයෝගය දැක් වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුමේධ වීරවර්ධන හා ආචාර්ය කන්චන ගවේෂ් ගජනායක මහත්වරුනටත් ලේඛකයන්ගේ ස්තුතිය හිමි වේ.




## ඵලක



ඵලක අංක 1ඃ සිතුවම් සහිත ගල් ඇන්දේ ඉදිරිපස පෙනුම



ඵලක අංක 2ඃසිතුවම් සහිත ගල් තලය




**ඵලක අංක 3:සිතුවම් පොකුර අංක i: අංක 1 හා අංක 2 සිතුවම් (සිතුවම් සහිත ගල් තලයේ සිදු වී ඇති පැලීම් තවදුරටත් ඇති වීම වැළැක්වීම සඳහා මැලියම් යොදා ඇති ආකාරය ද මෙම ඵලකයෙන් නිරූපණය වේ.)**



**ඵලක අංක 4:අංක 2 සිතුවම් පොකුර**






**ඵලක අංක 5: අංක 3 සිතුවම් පොකුර**



**ඵලක අංක 6: අංක 4 සිතුවම් පොකුර**




ඵලක අංක 7: ස්වභාවික පැලීම් පරික්ෂා කිරීම සඳහා යොදා ඇති වීදුරු පටි

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අඹන්වල, චන්දිම බණ්ඩාර හා මහින්ද කරුණාරත්න. (2012). **නුවරඑළිය දිස්ත්‍රික්කයේ ලිහිණියාගල ප්‍රාථමික ශෛලියේ ගුහා සිතුවම්**: නැවත සමීක්ෂණයක්, පුන්කලස, දේශන පත්‍රිකා, ජාතික පුරාවිද්‍යා සමුළුව, වෙළුම ii, සංස්කරණය දීපාල් විජේතිලක, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පිටු අංක 358-375

දැරණියගල, ශිරාන්. (1991).**ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය**, පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා i, පරිවර්තනය සෝමපාල ජයවර්ධන හා එ නිමල් පෙරේරා, කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

වජිර හිමි, හබරකඩ. (1998). **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්**, කෞතුකාගාර, පස්වෙනි කලාපය, සංස්. එච්. ඒ. ඒකනායක හා ආර්. හේවගේ, කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 6-12

වික්‍රමසිංහ, එස්. (2001). **උස්සාගලින් ප්‍රාග් ඓතිහාසික හෝ වැදි සිතුවම් සහිත ගල් ගුහාවක්**, කෞතුකාගාර, 7 වෙනි කලාපය, සංස්. එච්. ඒ. ඒකනායක හා ආර්. හේවගේ, කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 62-72





Nandadeva, B.D. (1986). **Rock Art Sites in Sri Lanka**: a Catalogue, Ancient Ceylon, No.6, Colombo: Department of Archaeology, 173-207pp

Nandadeva, B.D. (1992). **Rock Art of Sri Lanka, Rock Art in The Old World**, IGNCA Rock Art Series – 1, ed.by. M. Lorblanchet, New Delhi: Indira Gandhi National Centre for The Arts, (337-347pp.)

Perera, H.N. (2010).**Prehistoric Sri Lanka**: Late Pleistocene Rockshelters and an Open-Air Site, Oxford: British Archaeology Report International Series 2142

Somadeva, Raj. (2012).**Rock Paintings and Engravings Sites in Sri Lanka**,Colombo: Postgraduate Institute of Archaeology.

Wijethunge, Chintaka C. (2012). **Recent Discoveries of Sri Lankan Primitive Rock Art: a Catalogue**, Punkalasa, Research Papers National Archaeological Symposium, Vol. II, Edited By Deepal Wijethilaka, Colombo: Department of Archaeology, 208-224

Wijeypala, W. H. (1997).**New Light onThe Prehistory of Sri Lanka**; In the Context Of Resent Investigations At Cave Sites. A thesis submitted for the degree of Doctor of Philosophy of the University of Peradeniya. Sri Lanka. (Unpublished)